# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2306/88 – 2022 නොවැම්බර් මස 19 වැනි සෙනසුරාදා – 2022.11.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/13/28/2013.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2022.04.08 වන දින අංක 2274/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2022.03.30 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. කේ. එන්. එස්. හේරත් මයා, "සරාගී", වැල්ලෙතොට, පාලටුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ - 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, හක්මණ ඩිපෝව, මුලටියන.

අතර පවත්නා 2022.03.29 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිලිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. සී. ආර්. ඒ. උපාලි නිශ්ශංක ගුණසේකර මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු එස්. සී. ආර්. ඒ. උපාලි නිශ්ශංක ගුණසේකර මයා බේරුම්කරණ ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දුන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2022.03.30 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දීය.

EOG - 11 - 0227/1

මගේ අංකය: IR/13/28/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**
**4 (1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුව අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. කේ. එන්. එස්. හේරත් මයා, "සරාගී", වැල්ලෙතොට, පාලටුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුල පාර, කොළඹ - 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, හක්මණ ඩිපෝව, මුලටියන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

මාතලේ, හිග්ගොල්ල පාර, පළමු පටුමඟ, 34/ 64, ඒ. බී. හේරත් මයා

පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දීය.

EOG - 11 - 0227/2

---

මගේ අංකය: IR/13/28/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන**

**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. කේ. එන්. එස්. හේරත් මයා, "සරාගී", වැල්ලෙතොට, පාලටුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුල පාර, කොළඹ - 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, හක්මණ ඩිපෝව, මුලටියන.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හක්මන ඩිපෝවේ සහකාර කළමනාකාර ඉංජිනේරුවරයකු වශයෙන් සේවයේ නිරතව සිටි එච්. කේ. එන්. එස්. හේරත් මහතාට 2011.08.27 වන දින සිට වේතන රහිතව සේවය තහනම් කර විනය පරීක්ෂණයෙන් අනතුරුව ලබා

දුන් දඬුවම් තුළින් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.”

2022 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

EOG - 11 - 0227/3

---

මගේ අංකය: IR/COM/03/2021/55.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**
**4 (1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිලිබඳව,

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, (ඩබ්. ඒ. සරත් මයා ඇතුළු සේවකයින් 20 දෙනා), අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ - 10.

*සහ*

චීෆ්වේ කටුනායක (ප්‍රයිවට්) ලිමිටඩ්, රින්ග් රෝඩ් 03, දෙවන අදියර, ආයෝජන ප්‍රවර්ධන කලාපය, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බොරලැස්ගමුව, ජී. එච්. පෙරේරා මාවත, අංක 43/1, නීතිඥ ටී. සී. ජේ. පීරිස් මහතා

පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දීය.

EOG - 11 - 0228/1

මගේ අංකය: IR/COM/03/2021/55.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන,**
**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, (ඩබ්. ඒ. සරත් මයා ඇතුළු සේවකයින් 20 දෙනා), අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ - 10.

*සහ*

චීෆ්වේ කටුනායක (ප්‍රයිවට්) ලිමිටඩ්, රින්ග් රෝඩ් 03, දෙවන අදියර, ආයෝජන ප්‍රවර්ධන කලාපය, කටුනායක.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ

"චීෆ්වේ කටුනායක (ප්‍රයිවට්) ලිමිටඩ්. හි සේවයේ යොදවා සිටි ඩබ්. ඒ. සරත් මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 20 දෙනා සිය කැමැත්තෙන් ආයතනයේ සේවය හැර ගිය අය සේ සලකා ඔවුන්ගේ සේවය අවසන් කිරීම අසාධාරණ හා අයුක්ති සහගත ද යන්නත් එසේ අසාධාරණ හා අයුක්ති සහගත නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

1. ඩබ්. ඒ. සරත්
2. එච්. ජී. ජී. සරෝජා සමන්කුමාරි
3. ඩී. එම්. ලලිතා කාන්ති දිසානායක
4. කේ. ජී. ඩී. කරුණාවතී
5. ඩබ්. පී. අයිරාංගනී සේරසිංහ
6. ටී. ජී. නවරත්න බණ්ඩා
7. කේ. ජී. සරෝජනී කුමාරි
8. ඩී. පී. ජී. එස්. දෙමටාවල
9. එච්. ජී. රංජනී ශ්‍රියාලතා
10. එල්. ටී. නිලූකා චන්ද්‍රසිරි
11. ආර්. ඩී. අනුලාවතී
12. ආර්. එම්. ශ්‍රියානි
13. ආර්. ජී. ජිනාදරි විමලසේන
14. කේ. පී. ඩබ්. රුවන්ති තුෂංගා
15. ඒ. බී. ජී. ඩබ්. අතුරලිය
16. ජී. ජී. සෝමාවතී
17. පී. ටී. උරේෂ් චතුරංග
18. ජේ. ජී. උදයාංගනී
19. ආර්. එම්. නන්දාවතී
20. ජේ. එම්. කාංචනා මධුභාෂිනී

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

EOG - 11 - 0228/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.